CA

THE INSTITUTE OF
**CHARTERED** ACCOUNTANTS
OF SRI LANKA

# රියදුරු සහ මැසෙන්ජර් සේවා ඇබෑර්තු

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA SRI LANKA) වරලත් ගණකාධිකාරිවරුන් **8,000** කට අධික සංඛ්‍යාවක් සඳහා සහාය දෙන ප්‍රමුඛතම වෘත්තීය ආයතනයක් වන අතර සිසුන් **30,000** ක අධික පදනමක් ඇති රටේ විශාලතම තෘතීයික අධ්‍යාපන ආයතනයකි.

ආයතනය ඉහළ මට්ටමේ වගකීමක් දැරිය හැකි කැපවීම, විශ්වාසය හා නිපුණතාවයෙන් යුක්ත අනුවර්තනය වීමේ හැකියාව ඇති කැපී පෙනෙන, ප්‍රතිඵල නැඹුරු සහ කාර්යක්ෂම සේවකයෙකු අපේක්ෂා කරයි.

## යුතුකම් හා වගකීම්:

- කාර්යමණ්ඩල සාමාජික සාමාජිකාවන් සහ නිර්දේශිත අනෙකුත් මගීන් වෘත්තීයමය සහ ආරක්ෂිත ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.
- බාහිරට යවනු ලබන දෛනික තැපැල්, පාර්සල්, බැංකු ලිපි ඇතුළු අනෙකුත් ලියකියවිලි නියමිත වේලාවට, අදාළ පාර්ශ්ව වෙත ලබාදීම.
- වාහනය ඇතුළත සහ පිටත ආරක්ෂිත ව සහ පිරිසිදු ව තබා ගැනීම. අවශ්‍ය විට දී නියමිත පැය ගණනට වඩා වැඩි පැය ගණනක් සහ නිවාඩු දිනවල වැඩ කිරීමේ හැකියාව.
- වාහනවල ප්‍රමාණවත් ලෙස ඉන්ධන පවත්වා ගැනීම සහ සැම විට ම සේවා කටයුතු සඳහා සූදානමින් තැබීමේ හැකියාව.

## අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද:

- රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර 10ක පළපුරුද්දක් සහ ශ්‍රී ලංකාවේ වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් තිබිය යුතු ය.
- මනා හික්මුණු පෞරුෂයකින් සහ යහපත් කායික හා මානසික සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.
- කොළඹ හා ඒ අවට මාර්ග පිළිබඳ පුළුල් අවබෝධයකින් යුක්ත විය යුතු ය.
- වයස අවුරුදු 45 ට අඩු විය යුතු අතර, දක්ෂ රියදුරෙකු විය යුතු ය.

රැකියාව සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ට, කර්මාන්ත ප්‍රමිතීන්ට සමගාමී ව තරඟකාරී වේතන පැකේජයක් සහ තවත් ප්‍රතිලාභ රැසක් පිරිනමනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ඥාතීන් නොවන දෙදෙනෙකුගේ සම්බන්ධතා තොරතුරු සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් පහත දක්වා ඇති ලිපිනයට එවන ලෙස හෝ දැන්වීම් පළ කළ දින සිට දින 7ක් ඇතුළත careers@casrilanka.org යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපෑලෙහි විෂය සඳහන් කරන තීරුවේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු වේ.

ඕනෑම ආකාරයක කාරණයක් නිසා අයදුම් පත ප්‍රතික්ෂේප විය හැකි අතර, අයදුම් කරුවන් කිහිප දෙනෙකු පමණක් තෝරා ගැනේ.

මානව සම්පත් ප්‍රධානී
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
30 ඒ, මලලසේකර මාවත, කොළඹ 07
විද්‍යුත් තැපෑල: careers@casrilanka.org